# ඇලෝපේෂියා ඒරියේටා (Alopecia Areata)

සාමාන්‍ය ව්‍යවහාරයේදී උඳුගොව්වන් කෑම ලෙස හැඳින්වුවද, මෙය සතෙකු නිසා ඇතිවන තත්ත්වයක් නොවන බව වටහා ගත යුතුය.

ඕනෑම වයසක ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වයටම එක ලෙස මෙය වැළඳිය හැක.

ශරීර අභ්‍යන්තරයේ ඇතිවන ප්‍රතිශක්ති පද්ධතියේ වෙනස් කම් නිසා මෙය හට ගන්නා බව දැනට පවතින මතයයි. මානසික ආතතිය ද සමහරවිට බලපෑ හැකිය.

මෙය බෝවන රෝග තත්ත්වයක් නොවන අතර විටමින් හෝ පෝෂණ ඌනතාවක් ද නොවේ.

## (1) රෝග ලක්ෂණ මොනවාද?

හිසකෙස් ගැලවීම වෘත්තාකාර පැල්ලම් වශයෙන් දැකිය හැක.

මෙහිදි සාමාන්‍යයෙන් හිසේ කිසිදු ආකාරයක කැසීමක් හෝ වේදනාවක් ඇති නොවේ.

එක් කුඩා පැල්ලමක සිට විශාල පැල්ලම් රාශියක් දක්වා රෝගය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැක.

කලාතුරකින් සම්පූර්ණ හිසටම හා ශරීරයටම බලපෑ හැක. යලි වැවෙන කෙස් ගස් මුලින් ඇතැම් විට සුදු පැහැති අතර පසුව සාමාන්‍ය පැහැයට පත්වේ.

සමහරුන්ගේ නියපොතුවල ඉතා කුඩා වලවල් දැකිය හැක.

## (2) රෝගය හඳුනා ගන්නේ කෙසේද?

චර්ම රෝග විශේෂඥයකු විසින් පරීක්ෂා කිරීමෙන් පසුව මෙය පහසුවෙන් හඳුනාගත හැක. නමුත් යම් විශේෂ අවස්ථාවලදී සමේ සිදුකරන පටක පරීක්ෂණයකින් (Biopsy) පසුව රෝග විනිශ්චය තහවුරු කර ගනු ලැබේ.

ඇලෝපේෂියා ඒරියේටා හා සම්බන්ධ වෙනත් ප්‍රතිශක්ති පද්ධතියේ අසාමාන්‍ය තත්ත්ව (උදාඃ- දියවැඩියාව / තයිරොයිඩ් ග්‍රන්ථි ආශ්‍රිත අසාමාන්‍යතා) හඳුනාගැනීම සඳහා සමහර අවස්ථාවල දී රුධිර පරීක්ෂණ සිදුකරනු ලැබේ.

## (3) රෝගයට ඇති ප්‍රතිකාර ක්‍රම මොනවාද?

සමහර අවස්ථාවල ප්‍රතිකාර කිරීමෙන් තොරවම හිසකෙස් නැවත වර්ධනය විය හැක.

(නමුත් යළි මෙම තත්ත්වය ඇති වීමේ අවධානමක් පවතී)

එසේ නොමැති අවස්ථාවල ලබාදිය හැකි ප්‍රතිකාර ක්‍රම නම්,

- Steroid ආලේපන
- Steroid නික්ෂේපන අදාළ ස්ථානයට එන්නත් කිරීම
- Steroid mini pulse
- Methotrexate ඖෂධය
- පාරජම්බුල කිරණ ප්‍රතිකාර (UVA / UVB)
- PRP ප්‍රතිකාරය - රුධිර පට්ටිකා සාන්ද්‍රගත තරලය
- වෙනත් - wigs (බොරු කොණ්ඩය), Camouflage

මෙම රෝග තත්ත්වය නිසා ශාරීරික වශයෙන් කිසිදු අහිතකර තත්ත්වයක් ඇති නොවන බව පැහැදිලිව කිව හැක.

නමුත් බොහෝ දෙනාට මෙය මානසික හා සාමාජීය වශයෙන් පීඩාකාරී විය හැකි බවත් මුල් අවස්ථාවේ ප්‍රතිකාර සඳහා යොමු වීමත් වැදගත්ය.